විශ්‍රාම වැටුප් චක්‍රලේඛ: 02/2025 (සංශෝධන I)

මගේ අංකය: Pen/Pol/06/16-2025
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත
කොළඹ 10.
2025.11. 22

දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**2025 අයවැය යෝජනා අනුව පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ විශ්‍රාමික නිලධරයන්ගේ විශ්‍රාම වැටුප 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත ප්‍රතිශෝධනය කිරීම**

පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ විශ්‍රාමික නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනයට අදාළව 2025.11.14 දිනැතිව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2025 (I) නිකුත් කර ඇත.

02. 2025.07.01 දිනැතිව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2025 සහ 2025.07.23 දිනැතිව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 02/2025 හි විධිවිධාන අනුව පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ විශ්‍රාමික නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කළ යුතු ය.

03. එහි දී පාර්ලිමේන්තු විශ්‍රාමික නිලධරයන්ගේ විශ්‍රාම වැටුප 2025.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2018.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත ප්‍රතිශෝධනය කළ යුතු අතර ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප සකස් කරන තෙක් වූ කාලසීමාව තුළ එනම් 2025 ජූලි මස සිට 2025 නොවැම්බර් මස දක්වා මාසිකව ගෙවීම් කර ඇති රුපියල් 2,500/- බැගින් වූ දීමනාව අයකර ගැනීම සිදු කළ යුතු ය.

04. ඉහත පරිදි විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2025 (I) හි (04) ඡේදයේ සඳහන් කර ඇති පරිදි මීට පෙර විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන ගණනය කිරීම්වල දී සිදු වී ඇති යම් දෝෂයක් වේ නම් එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතු අතර එහි දී අඩුවෙන් ගෙවීම් සිදු කර තිබේ නම් එය ගණනය කර නැවත ගෙවීමටත් වැඩිපුර ගෙවීම් සිදු කර තිබේ නම් එය ගණනය කර නැවත අයකර ගැනීමටත් කටයුතු කළ යුතු ය.

05. විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 05/2025 මගින් හඳුන්වා දෙනු ලැබූ ආකෘති පත්‍රය භාවිත කරමින් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට අදාළ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන සකස් කිරීම සිදු කළ යුතු අතර එම

ආකෘති පත්‍රය සකස් කිරීම සහ පරීක්ෂා කිරීම විශ්‍රාම වැටුප් විෂය භාර නිලධාරින් විසින් ද නිර්දේශ කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි විසින් ද අනුමත කිරීම ප්‍රාදේශීය ලේකම් විසින් ද සිදු කළ යුතු ය. ඉන්පසුව ආකෘති පත්‍රයේ සඳහන් තොරතුරු විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන මොඩියුලයේ කාණ්ඩ 03 (Category 03) යටතේ ඇතුළත් කළ යුතු අතර එම ආකෘති පත්‍රය පරිලෝකනය (Scan) කර පහත සඳහන් විද්‍යුත් ලිපිනයන් මගින් මෙම දෙපාර්තමේන්තුවේ මාසික ගෙවීම් අංශය වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු ය.

- malakad@pensions.gov.lk
- penmonth@pensions.gov.lk

06. ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප 2025 දෙසැම්බර් මස හිමිගැන්වීමට හැකිවන පරිදි මෙම ප්‍රතිශෝධන සකස් කිරීමේ කටයුතු සිදු කළ යුතු ය. වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට පවතින අවස්ථාවල දී ගෙවිය යුතු නිවැරදි ප්‍රතිශෝධන විශ්‍රාම වැටුප 2025 දෙසැම්බර් මාසයේ දී ගෙවීම් කිරීම සඳහා එම තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කළ යුතු අතර, වැඩිපුර ගෙවීම් අයකර ගැනීම සඳහා අදාළ විශ්‍රාම වැටුප් ගොනුව මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

07. පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2016 සහ 2018 වර්ෂයට අදාළ ප්‍රතිශත වගුව ඇමුණුම 01 සහ 02 වශයෙන් ඇතුළත් කර ඇත.

08. මෙම චක්‍රලේඛය අනුව කටයුතු කිරීමේ දී එහි විධිවිධාන සම්බන්ධයෙන් පැහැදිලි කරගැනීම් හෝ වැඩිදුර උපදෙස් අවශ්‍යවන අවස්ථාවල දී සහ පැනනගින තාක්ෂණික ගැටළු නිරාකරණය කරගැනීම සඳහා පහත සඳහන් දුරකතන අංක වෙත සම්බන්ධ විය හැකි ය.

| අනු අංකය | තනතුර | දුරකථන අංකය |
|---|---|---|
| 01. | අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා විමර්ශන) | 011 2 421 786 |
| 02. | අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්) | 011 2 320 045 |
| 03. | අධ්‍යක්ෂ (ඩිජිටල් පරිපාලන සහ සේවා) | 011 2 431 729 |
| 04. | අධ්‍යක්ෂ (වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්) | 011 2 336 913 |
| 05. | ගණකාධිකාරි (විෂමතා) | 011 2 441 730 |

| | | |
|---|---|---|
| 06. | ගණකාධිකාරී (මාසික ගෙවීම්) | 011 2 331 791 |
| 07. | සහකාර අධ්‍යක්ෂ (විදේශ විශ්‍රාම වැටුප්) | 011 2 327 752 |

Achami


චාමින්ද හෙට්ටිආරච්චි

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

දුරකතනය : 011 2 421786

ෆැක්ස් : 011 2 431413

විද්‍යුත් ලිපිනය : pen7policydep@gmail.com


**පිටපත් :**

1) ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.ස.
2) අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.
3) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය - කරු. දැ.ගැ.ස.
4) ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
5) ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
6) ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
7) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
8) ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
9) ත්‍රිවිධ හමුදාධිපතිවරුන් - කරු. දැ.ගැ.ස.
10) විගණකාධිපති - කරු. දැ.ගැ.ස.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 06/2016

මගේ අංකය: ඩී.එම්.එස්./වැටුප්/පොදු
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.
2016.11. 07

පාර්ලිමේන්තුවේ මහ ලේකම්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය කිරීම - 2016**

2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 සහ ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන පදනම් කරගෙන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණයන් 2016.01.01 දින සිට අදියර 05කින් උපලේඛන II හි සඳහන් පරිදි ක්‍රියාත්මක කිරීමට 2016.10.25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

**02.** නව වැටුප් ව්‍යුහය තුළ පහත සඳහන් දීමනා අන්තර්ගත කර ඇත.

(i) 2011.12.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 31/2011 සහ 2012.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2012 අනුව ගෙවනු ලබන විශ්‍රාම වැටුපට හිමිකම් රහිත විශේෂ දීමනාව.

(ii) 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2014, 2014.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2014(I) සහ 2015.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2015 අනුව මාසිකව ගෙවනු ලබන රු.10,000/-ක් වන අන්තර් දීමනාව.

## 03. වැටුප් පරිවර්තනය

03.1 දැනට පවතින වැටුප් පරිමාණයන්හි සිට නව වැටුප් පරිමාණයන්ට වැටුප් පරිවර්තනය කිරීම පියවරට පියවර තැබීමේ ක්‍රමය යටතේ සිදු කළ යුතුය. එහෙත් මෙම වැටුප් සංශෝධනය අදියර 05ක් යටතේ සිදු කරන බැවින් උපලේඛන II හි සඳහන් පරිවර්තන වගුව අනුව වැටුප් පරිවර්තනය කළ යුතුය.

03.2 වැටුප් පරිවර්තනය කිරීමේ දී 2015.12.31 දිනට පවත්නා වැටුප් ව්‍යුහය යටතේ අදාළ වන තනතුර/ සේවා කාණ්ඩය හා ඊට අදාළ වැටුප් ක්‍රමයට අනුරූපීව මෙම චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් තනතුර/ සේවා කාණ්ඩය හා අදාළ වැටුප් ක්‍රමය හඳුනාගත යුතුය. ඒ අනුවම ඊට අදාළ උපලේඛන II හි සඳහන් පරිවර්තන වගුව තෝරාගත යුතුය.

03.3 නියමිත පරිවර්තන වගුව අනුව 2015.12.31 දිනට අදාළ වූ වැටුප් පියවරට අනුරූපී 2016.01.01 දිනට නියමිත වැටුප් පියවර අනුව අදාළ වන වැටුප් තලයෙහි පිහිටුවිය යුතුය. මේ සඳහා මෙම චක්‍රලේඛයේ ඇමුණුම I වශයෙන් ඇති වැටුප් පරිවර්තන ආකෘතිය උපයෝගී කර ගත යුතුය.

03.4 ඉහත 03.3 හි අනුගමනය කළ ක්‍රමවේදය අනුවම 2017.01.01, 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 යන දිනයන් හි දී එළඹෙන වැටුප් පරිවර්තනයන් ද ඒ ඒ අවස්ථාවේදී සිදුකළ යුතුය. මේ සඳහා උපලේඛන II හි එක් එක් වර්ෂය යටතේ සඳහන් කර ඇති වැටුප් තලයන් අදාළ කරගත යුතුය. මෙම පරිවර්තනය සඳහා එක් එක් වර්ෂය වෙනුවෙන් ඇමුණුම II, III, IV සහ V වශයෙන් ඇති වැටුප් පරිවර්තන ආකෘති උපයෝගී කර ගත යුතුය.

## 04. වැටුප් වර්ධක ගණනය කිරීම

### 04.1 වැටුප් පරිමාණය තුළ වැටුප් වර්ධකය ගණනය කිරීම

(i) 2016.01.01 දින සිට 2016.12.31 දක්වා වූ කාලය තුළ වැටුප් වර්ධකය උපයා ගන්නා අවස්ථාවේ දී ඉහත 03.3 හි පිහිටුවන ලද වැටුප් තලයට ආසන්න ඉහළ වැටුප් තලයේ පිහිටුවිය යුතුය. ඒ අනුව 2016 වර්ෂයට නියමිත වැටුප් වර්ධකයේ වටිනාකම ලෙස සැලකිය යුත්තේ අදාළ වැටුප් තලයන් දෙක අතර වෙනස පමණක් විය යුතුය.

උදා :- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයේ "A" කාණ්ඩයේ පුහුණු කම්කරු (සිවිල්) තනතුරක් සඳහා 2015.12.31 දිනට නියමිතව තිබූ වැටුප් පරිමාණයේ රු.12730/- වැටුප් තලය ලැබූවකු සඳහා 2016.01.01 දිනට රු.15450/- වැටුප් තලය අදාළ වේ. වැටුප් වර්ධක දිනය 2016.10.01 වන්නේ නම් සහ එදිනට වැටුප් වර්ධකය උපයා ගෙන ඇත්නම් වැටුප් වර්ධකය සමඟ ඔහුට හිමි වන වැටුප් තලය වන්නේ රු.15608/- වේ. ඒ අනුව 2016 වර්ෂය සඳහා වැටුප් වර්ධකය වශයෙන් රු.158/- ක් හිමි වේ.

### 04.2 වැටුප් පරිමාණයේ උපරිමයෙන් ඔබ්බට වැටුප් වර්ධක ලබා දීම

(i) වැටුප් පරිමාණයක උපරිමයට පැමිණි අයෙකුට උපරිමයෙන් ඔබ්බට වැටුප් වර්ධක ගෙවා තිබිය හැකිය. එවැනි අවස්ථාවක දී 2016.01.01 දින සිට අදාළ විය යුතු වැටුප් තලය තීරණය කිරීම සඳහා උපලේඛන II හි අදාළ වැටුප් පරිවර්තන වගුවෙහි නියමිත තීරුවෙහි වැටුප් පරිමාණයේ අවසානයට ඇති වැටුප් තල දෙක අතර වෙනස වැටුප් වර්ධකය ලෙස සලකා වැටුප් පියවර ගණනය කළ යුතුය.

(ii) 2016.01.01 දිනෙන් පසුව වැටුප් පරිමාණයක උපරිමය ඉක්මවා වැටුප් වර්ධක උපයාගන්නා අවස්ථාවකදී ද ඉහත (I) හි පරිදි අදාළ වැටුප් පියවර ගණනය කළ යුතු ය.

## 05. දළ වැටුපෙහි ගැළපුම් දීමනාව

05.1 මූලික වැටුපට අමතරව ඉහත 02 ඡේදයෙහි සඳහන් දීමනා සමග 2015.12.31 දිනට ලද දළ වැටුප සහ මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් එක් එක් වර්ෂයට අදාළ මූලික වැටුප අතර වෙනස දළ වැටුපෙහි ගැළපුම් දීමනාවක් ලෙස ගණනය කොට එහි ඇතුළත් කර ඇත. ඒ අනුව එක් එක් වර්ෂය සඳහා නියමිත මූලික වැටුපට අමතරව ඊට අනුරූපී ගැළපුම් දීමනාව ද ගෙවිය යුතු ය. මෙම ගැළපීමේ දීමනාව මෙහි පහත 15.1 හි සඳහන් කාර්යය හැර වෙනත් කිසිදු කාර්යයක් සඳහා වැටුපෙහි කොටසක් වශයෙන් නොසැලකිය යුතු ය.

05.2 ඉහත 04.2 හි පරිදි උපරිමයෙන් ඔබ්බට වැටුප් පියවර ගණනය කළ අවස්ථාවකදී එම පියවරට අදාළ දළ වැටුපෙහි ගැළපුම් දීමනාව ද ගෙවිය යුතුය. මේ සඳහා පළමුව 2015.12.31 දිනට ලැබූ වැටුප් තලය හා ඉහත 02 ඡේදයේ සඳහන් කර ඇති චක්‍රලේඛ යටතේ හිමි දීමනාවන් පමණක් ඇතුළත් දළ වැටුප ගණනය කළ යුතුය. එම වැටුප හා ඉහත 04.2 යටතේ ගණනය කරන ලද වැටුප් තලය අතර මුල්‍යමය අවාසියක් වන්නේ නම් එම අගය දළ වැටුපෙහි ගැළපුම් දීමනාවක් වශයෙන් නියමිත වැටුප් තලය සමඟ ගෙවිය යුතුය.

උදා :- 2015.12.31 දින "A" කාණ්ඩයේ පුහුණු කම්කරු (සිවිල්) තනතුරක් රු.15920/- න් ඔබ්බට වැටුප් වර්ධක තුන (03) ක් ලබා රු.16400/- වැටුප් තලයේ සිටි තැනැත්තෙකු සඳහා 2016.01.01 දිනට අදාළ මූලික වැටුප හා ගැළපුම් දීමනාව ගණනය කිරීම.

- **2016.01.01 දිනට අනුරූපී මූලික වැටුප රු.19904/- කි.**
  2016 වර්ෂයට අදාළ වැටුප් වර්ධක අගය රු.194/- යි. මෙය ආසන්න වැටුප් වර්ධක 2 අතර වෙනසයි. (19322 - 19128 = 194)
  ඒ අනුව රු.582/- ක් (194x3), රු.19322/- ට එකතු කිරීමෙන් රු.19904/- ලබා ගෙන ඇත.

- **2016.01.01 දිනට ගැළපුම් දීමනාව රු.9776/- කි.**
  රු.16400/- වැටුප් තලයට අදාළ දීමනාවන් :
  15% + 5% + රු.10000 = රු.13280/-
  දීමනා සමඟ වැටුප :
  රු. 16400 + රු.13280 = රු.29680/-
  ගැළපුම් දීමනාව :
  රු.29680 - රු.19904 = රු.9776/-

- ඒ අනුව 2016.01.01 දිනට ගෙවිය යුතු මූලික වැටුප = රු. 19904/-
  දළ වැටුපෙහි ගැළපුම් දීමනාව = රු. 9776/-

## 06. උසස්වීමකදී වැටුප් පරිවර්තනය

06.1 මෙම චක්‍රලේඛය අනුව අදියර ක්‍රමය යටතේ වැටුප් පරිවර්තනය සිදු කරනු ලබන කාල සීමාව තුළ (2016.01.01 සිට 2020.01.01 දක්වා) උසස්වීම් ලබන අවස්ථාවක දී එම උසස්වීම්වලට අදාළ වැටුප් පරිවර්තනයන්හි දී උපයෝගී කර ගත යුත්තේ උපලේඛන II හි සඳහන් එම වර්ෂයට අදාළ තීරුවෙහි දැක්වෙන වැටුප් තලයන් වේ.

උදා :- 2017.01.01 දින සිට "B" - 2016 වැටුප් පරිමාණයේ රු.22496/- ක වැටුපක් සහ රු.6416/- ක ගැළපුම් දීමනාවක් ලබමින් සිටි ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සේවකයෙකු 2017.03.01 දින "C" - 2016 වැටුප් කේතයට අදාළ තනතුරකට උසස්වීමක් ලැබුවේ නම් එම නිලධරයා C - 2016 වැටුප් පරිමාණයේ රු.22766/- වැටුප් තලයේ පිහිටුවා රු.6374/- ක ගැළපුම් දීමනාවක් ලබා දිය යුතුය.

## 07. අනෙකුත් දීමනා

07.1 මෙම චක්‍රලේඛයේ 2 ඡේදයෙහි සඳහන් කර ඇති චක්‍රලේඛ මගින් ලබා දී ඇති දීමනා අන්තර්ගත කරමින් නව වැටුප් ව්‍යුහය සකස් කර ඇති බැවින් 2016.01.01 දින සිට එම දීමනා ගෙවීම නතර කළ යුතුය.

07.2 අංක 37/2013 හා 2013.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ගෙවනු ලබන මසකට රු.7800/- ක් වන ජීවන වියදම් දීමනාව තවදුරටත් ගෙවිය යුතුය.

## 08. විශ්‍රාම වැටුප්

08.1 මෙම චක්‍රලේඛයේ වැටුප් ව්‍යුහය මත 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලබන විශ්‍රාමිකයින් සඳහා විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී අදාළ කරගත යුත්තේ උපලේඛන II හි සඳහන් පරිදි ඔවුන් අවසානවරට ලද වැටුප් පියවර විය යුතු ය.

08.2 උපලේඛන I හි සඳහන් වැටුප් පරිමාණයන් 2020.01.01 දින සිට සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වීමත් සමඟම 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලබන විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප ද ඒ අනුව සංශෝධනය කරනු ලබන අතර ඒ සම්බන්ධ උපදෙස් පසුව නිකුත් කරනු ඇත. 2016.01.01 දින සිට 2019.12.31 දක්වා අතර කාලය තුළ දී විශ්‍රාම වැටුප් සංශෝධනයන් සිදු කරනු නොලැබේ.

08.3 අංක 05/2015 සහ 2015.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විශ්‍රාමිකයන් සඳහා ගෙවනු ලබන මසකට රු.3500/- ක් වන අන්තර් දීමනාව මෙම චක්‍රලේඛය යටතේ 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලබන විශ්‍රාමිකයින් සඳහා නොගෙවිය යුතුය. එහෙත් අංක 37/2013 සහ 2013.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විශ්‍රාමිකයින් සඳහා ගෙවනු ලබන මසකට රු. 3525/- ක් වන ජීවන වියදම් දීමනාව ගෙවිය යුතුය.

## 09. පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීම

09.1 මෙම චක්‍රලේඛයේ සඳහන් වැටුප් ව්‍යුහය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන 2020.01.01 දින දක්වා සිදු කරනු ලබන බඳවාගැනීම්/ උසස් කිරීම් වල දී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීමේ දී උපලේඛන I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය අදාළ කරගත යුතුය. එහෙත් ගෙවීම් සිදුකළ යුත්තේ උපලේඛන II හි සඳහන් පරිදි විය යුතු බැවින් ඒ බැව් ද එම පත්වීම් ලිපිවල සඳහන් කළ යුතුය.

## 10. දෛනික වේතන

10.1 අනියම්/ දෛනික වැටුප්ලාභී පදනම මත සේවය කරන සේවකයින්ට ගෙවනු ලබන දෛනික වේතනය ද 2016.01.01 දින සිට මෙම චක්‍රලේඛය පූර්ණ වශයෙන් ක්‍රියාත්මකවන 2020.01.01 දින දක්වා වාර්ෂිකව සංශෝධනය කළ යුතු ය. ඒ අනුව උපලේඛන IIහි එක් එක් වර්ෂයට අදාළව දක්වා ඇති ඒ ඒ සේවා ගණයේ ආරම්භක ශ්‍රේණියේ ආරම්භක මාසික වැටුප 30න් බෙදා දෛනික වේතනය ගණනය කළ යුතු ය. එයට අතිරේකව එම වැටුප් පියවරට අදාළ ගැළපීමේ දීමනාව ද 30 න් බෙදා දීමනාවක් ලෙස ගෙවිය යුතු ය.

## 11. වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් ගෙවනු ලබන දීමනා

11.1 කිසියම් නිලධරයෙකු සඳහා වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් දීමනාවක් ගෙවනු ලබන්නේ නම් එම දීමනා 2015.12.31 දිනට එම නිලධාරියා ලැබූ දීමනාවේ පැවති මූල්‍යමය අගයට සීමා කළ යුතු ය. 2016.01.01 දිනට පසු පත්කරනු ලබන නිලධරයෙකුට මෙම දීමනාව ගණනය කිරීම සඳහා, එම නිලධාරියා 2015.12.31 දිනට එම තනතුරට පත්කරනු ලැබුවේ නම් ලබා දිය යුතුව තිබූ වැටුප කල්පිත වශයෙන් අදාළ කරගත යුතුය.

12. වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල්

12.1 වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා උපලේඛන II හි සඳහන් මූලික වැටුපෙන් දායක මුදල් අයකිරීම පහත සඳහන් පරිදි විය යුතු ය.

සේවා කාණ්ඩ A සිට F දක්වා - 6%

සේවා කාණ්ඩ G සිට N දක්වා - 7%

13. කාර්යක්ෂමතා කඩඉම්

13.1 කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කළ යුතු කාලය බඳවා ගැනීමේ පරිපාටි අනුව නොවෙනස්ව ක්‍රියාත්මක වේ.

14. වැටුප් වර්ධක දිනය

14.1 මෙම වැටුප් සංශෝධනය හේතුවෙන් වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

15. ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3:5 උප වගන්තියේ සඳහන් ණය/ අත්තිකාරම් ලබාදීමේ දී මාසික අඩුකිරීම්වල එකතුවේ සීමාව

15.1 රජයේ නිලධරයෙකු ණය/ අත්තිකාරම් ලබා ගැනීමේ දී සලකා බලනු ලබන 40% සීමාව ගණනය කිරීමේ දී මෙහි සඳහන් මූලික වැටුප හා ගැලපීමේ දීමනාව ද අදාළ කර ගත යුතු ය.

16. රාජකාරී හා නිවාඩු දුම්රිය බලපත්‍ර

16.1 පවත්නා පහසුකම් යටතේ රජයේ නිලධරයන්ට වෙන්කළ හැකි ආසන ප්‍රමාණය පිළිබඳව අදාළ බලධරයන් විමසා වෙනත් නියමයක් කරන තුරු දුම්රිය බලපත්‍ර හිමිකම සම්බන්ධයෙන් දැනට පවත්නා විධිවිධාන නොවෙනස්ව ක්‍රියාත්මක වේ.

17. නැවත සේවයේ යෙදවූ නිලධරයකුගේ සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති නිලධරයන්ගේ වැටුප් හා දීමනා

17.1 විශ්‍රාම යාමෙන් අනතුරුව කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවා ඇති නිලධරයන්ට පවත්නා විධිවිධාන යටතේ ගෙවනු ලබන දීමනා වෙනත් නියමයක් කරන තුරු නොවෙනස්ව ක්‍රියාත්මක වේ.

17.2 කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති නිලධරයන්ට ගෙවනු ලබන වැටුප කොන්ත්‍රාත් කාල සීමාව තුළ සංශෝධනය නොකළ යුතු ය.

18. පොදු උපදෙස්

18.1 කිසියම් තනතුරකට ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශයක් රහිතව වැටුප් පරිමාණයන් අදාළ කර ඇත්නම් මෙම චක්‍රලේඛය යටතේ වැටුප් සංශෝධනය කිරීමට පෙර අදාළ කර ගත යුතු නිවැරදි වැටුප සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ලබා ගත යුතු ය.

18.2 2006.01.01 දිනට පසු ලබා දී ඇති පත්වීම් සඳහා අදාළ විය යුත්තේ නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර විය යුතු ය. ඉන් පරිබාහිර වැටුපක් ලබා දී ඇත්නම් මෙම චක්‍රලේඛය යටතේ වැටුප් සංශෝධනය කිරීමට පෙර එය නිවැරදි කළ යුතු වේ.

18.3 මෙම චක්‍රලේඛය අනුව නිලධරයෙකුට 2016.01.01 දිනට හිමි විය යුතු වැටුප තීරණය කිරීමේ දී 2006.01.01 දින හෝ එදිනට පසුව සිදු කළ වැටුප් සංශෝධන අනුව වැටුප සැකසීම සහ නිලධාරියාට අදාළ වැටුප් පරිවර්තන නිවැරදිව සිදු කර ඇති බවට අදාළ බලධරයන් තහවුරු කරගත යුතු ය.

19. වැඩිපුර ගෙවීම

19.1 මෙම උපදෙස් වැරදි ලෙස නිර්වචනය කිරීම හේතුවෙන් හෝ ලියවිලිවල වැරදීමක් හේතුවෙන් හෝ ගණනය කිරීමේ දී ඇතිවන වැරදීමක් හේතුවෙන් හෝ වෙනත් වැරදීමක් හේතුවෙන් හෝ කිසියම් නිලධරයෙකුට වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම් එවැනි වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු ගෙවීමට එම නිලධරයා බැඳී සිටී.

20. පැහැදිලි කරගැනීම් හා වැඩිදුර උපදෙස්

20.1 මෙම චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳව පැහැදිලි කිරීම් හා වැඩිදුර උපදෙස් අපේක්ෂා කරන්නේ නම් එවැනි ඉල්ලීම්, අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 01 ලිපිනය වෙත යොමු කළ යුතු ය.

O/C

ආර්.එච්.එස්. සමරතුංග
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :-

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
4. විගණකාධිපති
5. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

උපලේඛන I

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සඳහා වන වැටුප් ව්‍යුහය

# 2016

# Salary Structure for Staff of the Parliament of Sri Lanka
# 2016

ary Structure for Staff of the Parliament of Sri Lar

| Group | A-2016 | B-2016 | C-2016 | D-2016 | E-2016 | F-2016 | G-2016 | H-2016 | I-2106 | Ia-2016 | J-2016 | K-2016 | L-2016 | M-2016 | N-2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 270 | 300 | 330 | 380 | 660 | 755 | 755 | 755 | 1,335 | 1,335 | 1,630 | 1,630 | 2,170 | 2,700 | 2,925 |
| | 9 | 9 | 11 | 3 | 9 | 12 | 9 | 3 | 5 | 3 | 7 | 4 | 12 | 12 | 12 |
| | 300 | 330 | 380 | 445 | 755 | | 930 | 1,030 | 1,630 | 1,630 | 2,170 | 2,170 | | | |
| | 10 | 10 | 10 | 10 | 3 | | 6 | 13 | 8 | 8 | 6 | 8 | | | |
| | 330 | 380 | | 660 | | | | | | 2,170 | | | | | |
| | 6 | 3 | | 4 | | | | | | 2 | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| 1 | 25,520 | 28,250 | 30,350 | 32,330 | 34,605 | 40,545 | 43,565 | 47,340 | 52,955 | 58,295 | 62,595 | 67,485 | 76,175 | 88,000 | 98,650 |
| 2 | 25,790 | 28,550 | 30,680 | 32,710 | 35,265 | 41,300 | 44,320 | 48,095 | 54,290 | 59,630 | 64,225 | 69,115 | 78,345 | 90,700 | 101,575 |
| 3 | 26,060 | 28,850 | 31,010 | 33,090 | 35,925 | 42,055 | 45,075 | 48,850 | 55,625 | 60,965 | 65,855 | 70,745 | 80,515 | 93,400 | 104,500 |
| 4 | 26,330 | 29,150 | 31,340 | 33,470 | 36,585 | 42,810 | 45,830 | 49,605 | 56,960 | 62,300 | 67,485 | 72,375 | 82,685 | 96,100 | 107,425 |
| 5 | 26,600 | 29,450 | 31,670 | 33,915 | 37,245 | 43,565 | 46,585 | 50,635 | 58,295 | 63,930 | 69,115 | 74,005 | 84,855 | 98,800 | 110,350 |
| 6 | 26,870 | 29,750 | 32,000 | 34,360 | 37,905 | 44,320 | 47,340 | 51,665 | 59,630 | 65,560 | 70,745 | 76,175 | 87,025 | 101,500 | 113,275 |
| 7 | 27,140 | 30,050 | 32,330 | 34,805 | 38,565 | 45,075 | 48,095 | 52,695 | 61,260 | 67,190 | 72,375 | 78,345 | 89,195 | 104,200 | 116,200 |
| 8 | 27,410 | 30,350 | 32,660 | 35,250 | 39,225 | 45,830 | 48,850 | 53,725 | 62,890 | 68,820 | 74,005 | 80,515 | 91,365 | 106,900 | 119,125 |
| 9 | 27,680 | 30,650 | 32,990 | 35,695 | 39,885 | 46,585 | 49,605 | 54,755 | 64,520 | 70,450 | 76,175 | 82,685 | 93,535 | 109,600 | 122,050 |
| 10 | 27,950 | 30,950 | 33,320 | 36,140 | 40,545 | 47,340 | 50,360 | 55,785 | 66,150 | 72,080 | 78,345 | 84,855 | 95,705 | 112,300 | 124,975 |
| 11 | 28,250 | 31,280 | 33,650 | 36,585 | 41,300 | 48,095 | 51,290 | 56,815 | 67,780 | 73,710 | 80,515 | 87,025 | 97,875 | 115,000 | 127,900 |
| 12 | 28,550 | 31,610 | 33,980 | 37,030 | 42,055 | 48,850 | 52,220 | 57,845 | 69,410 | 75,340 | 82,685 | 89,195 | 100,045 | 117,700 | 130,825 |
| 13 | 28,850 | 31,940 | 34,360 | 37,475 | 42,810 | 49,605 | 53,150 | 58,875 | 71,040 | 77,510 | 84,855 | 91,365 | 102,215 | 120,400 | 133,750 |
| 14 | 29,150 | 32,270 | 34,740 | 37,920 | | | 54,080 | 59,905 | 72,670 | 79,680 | 87,025 | | | | |
| 15 | 29,450 | 32,600 | 35,120 | 38,580 | | | 55,010 | 60,935 | | | | | | | |
| 16 | 29,750 | 32,930 | 35,500 | 39,240 | | | 55,940 | 61,965 | | | | | | | |
| 17 | 30,050 | 33,260 | 35,880 | 39,900 | | | | 62,995 | | | | | | | |
| 18 | 30,350 | 33,590 | 36,260 | 40,560 | | | | | | | | | | | |
| 19 | 30,650 | 33,920 | 36,640 | | | | | | | | | | | | |
| 20 | 30,950 | 34,250 | 37,020 | | | | | | | | | | | | |
| 21 | 31,280 | 34,630 | 37,400 | | | | | | | | | | | | |
| 22 | 31,610 | 35,010 | 37,780 | | | | | | | | | | | | |
| 23 | 31,940 | 35,390 | | | | | | | | | | | | | |
| 24 | 32,270 | | | | | | | | | | | | | | |
| 25 | 32,600 | | | | | | | | | | | | | | |
| 26 | 32,930 | | | | | | | | | | | | | | |

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

# වැටුප් පරිවර්තන වගු

# Salary Conversion Tables

Group - A - 2016

| Salary Step | As at 2015.12.31 | | As at 2016.01.01 | | As at 2017.01.01 | | As at 2018.01.01 | | As at 2019.01.01 | | As at 2020.01.01 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Basic Salary (Rs.) | Gross Salary (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) |
| 1 | 12,340 | 24,941 | 14,976 | 9,965 | 17,612 | 7,329 | 20,248 | 4,693 | 22,884 | 2,057 | 25,520 | - |
| 2 | 12,470 | 25,091 | 15,134 | 9,957 | 17,798 | 7,293 | 20,462 | 4,629 | 23,126 | 1,965 | 25,790 | - |
| 3 | 12,600 | 25,240 | 15,292 | 9,948 | 17,984 | 7,256 | 20,676 | 4,564 | 23,368 | 1,872 | 26,060 | - |
| 4 | 12,730 | 25,390 | 15,450 | 9,940 | 18,170 | 7,220 | 20,890 | 4,500 | 23,610 | 1,780 | 26,330 | - |
| 5 | 12,860 | 25,539 | 15,608 | 9,931 | 18,356 | 7,183 | 21,104 | 4,435 | 23,852 | 1,687 | 26,600 | - |
| 6 | 12,990 | 25,689 | 15,766 | 9,923 | 18,542 | 7,147 | 21,318 | 4,371 | 24,094 | 1,595 | 26,870 | - |
| 7 | 13,120 | 25,838 | 15,924 | 9,914 | 18,728 | 7,110 | 21,532 | 4,306 | 24,336 | 1,502 | 27,140 | - |
| 8 | 13,250 | 25,988 | 16,082 | 9,906 | 18,914 | 7,074 | 21,746 | 4,242 | 24,578 | 1,410 | 27,410 | - |
| 9 | 13,380 | 26,137 | 16,240 | 9,897 | 19,100 | 7,037 | 21,960 | 4,177 | 24,820 | 1,317 | 27,680 | - |
| 10 | 13,510 | 26,287 | 16,398 | 9,889 | 19,286 | 7,001 | 22,174 | 4,113 | 25,062 | 1,225 | 27,950 | - |
| 11 | 13,655 | 26,453 | 16,574 | 9,879 | 19,493 | 6,960 | 22,412 | 4,041 | 25,331 | 1,122 | 28,250 | - |
| 12 | 13,800 | 26,620 | 16,750 | 9,870 | 19,700 | 6,920 | 22,650 | 3,970 | 25,600 | 1,020 | 28,550 | - |
| 13 | 13,945 | 26,787 | 16,926 | 9,861 | 19,907 | 6,880 | 22,888 | 3,899 | 25,869 | 918 | 28,850 | - |
| 14 | 14,090 | 26,954 | 17,102 | 9,852 | 20,114 | 6,840 | 23,126 | 3,828 | 26,138 | 816 | 29,150 | - |
| 15 | 14,235 | 27,120 | 17,278 | 9,842 | 20,321 | 6,799 | 23,364 | 3,756 | 26,407 | 713 | 29,450 | - |
| 16 | 14,380 | 27,287 | 17,454 | 9,833 | 20,528 | 6,759 | 23,602 | 3,685 | 26,676 | 611 | 29,750 | - |
| 17 | 14,525 | 27,454 | 17,630 | 9,824 | 20,735 | 6,719 | 23,840 | 3,614 | 26,945 | 509 | 30,050 | - |
| 18 | 14,670 | 27,621 | 17,806 | 9,815 | 20,942 | 6,679 | 24,078 | 3,543 | 27,214 | 407 | 30,350 | - |
| 19 | 14,815 | 27,787 | 17,982 | 9,805 | 21,149 | 6,638 | 24,316 | 3,471 | 27,483 | 304 | 30,650 | - |
| 20 | 14,960 | 27,954 | 18,158 | 9,796 | 21,356 | 6,598 | 24,554 | 3,400 | 27,752 | 202 | 30,950 | - |
| 21 | 15,120 | 28,144 | 18,352 | 9,792 | 21,584 | 6,560 | 24,816 | 3,328 | 28,048 | 96 | 31,280 | - |
| 22 | 15,280 | 28,336 | 18,546 | 9,790 | 21,812 | 6,524 | 25,078 | 3,258 | 28,344 | - | 31,610 | - |
| 23 | 15,440 | 28,528 | 18,740 | 9,788 | 22,040 | 6,488 | 25,340 | 3,188 | 28,640 | - | 31,940 | - |
| 24 | 15,600 | 28,720 | 18,934 | 9,786 | 22,268 | 6,452 | 25,602 | 3,118 | 28,936 | - | 32,270 | - |
| 25 | 15,760 | 28,912 | 19,128 | 9,784 | 22,496 | 6,416 | 25,864 | 3,048 | 29,232 | - | 32,600 | - |
| 26 | 15,920 | 29,104 | 19,322 | 9,782 | 22,724 | 6,380 | 26,126 | 2,978 | 29,528 | - | 32,930 | - |

II

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

Group - B - 2016

| Salary Step | As at 2015.12.31 | | As at 2016.01.01 | | As at 2017.01.01 | | As at 2018.01.01 | | As at 2019.01.01 | | As at 2020.01.01 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Basic Salary (Rs.) | Gross Salary (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) |
| 1 | 13,655 | 26,453 | 16,574 | 9,879 | 19,493 | 6,960 | 22,412 | 4,041 | 25,331 | 1,122 | 28,250 | _ |
| 2 | 13,800 | 26,620 | 16,750 | 9,870 | 19,700 | 6,920 | 22,650 | 3,970 | 25,600 | 1,020 | 28,550 | _ |
| 3 | 13,945 | 26,787 | 16,926 | 9,861 | 19,907 | 6,880 | 22,888 | 3,899 | 25,869 | 916 | 28,850 | _ |
| 4 | 14,090 | 26,954 | 17,102 | 9,852 | 20,114 | 6,840 | 23,126 | 3,828 | 26,138 | 816 | 29,150 | _ |
| 5 | 14,235 | 27,120 | 17,278 | 9,842 | 20,321 | 6,799 | 23,364 | 3,756 | 26,407 | 713 | 29,450 | _ |
| 6 | 14,380 | 27,287 | 17,454 | 9,833 | 20,528 | 6,759 | 23,602 | 3,685 | 26,676 | 611 | 29,750 | _ |
| 7 | 14,525 | 27,454 | 17,630 | 9,824 | 20,735 | 6,719 | 23,840 | 3,614 | 26,945 | 509 | 30,050 | _ |
| 8 | 14,670 | 27,621 | 17,806 | 9,815 | 20,942 | 6,679 | 24,078 | 3,543 | 27,214 | 407 | 30,350 | _ |
| 9 | 14,815 | 27,787 | 17,982 | 9,805 | 21,149 | 6,638 | 24,316 | 3,471 | 27,483 | 304 | 30,650 | _ |
| 10 | 14,960 | 27,954 | 18,158 | 9,796 | 21,356 | 6,598 | 24,554 | 3,400 | 27,752 | 202 | 30,950 | _ |
| 11 | 15,120 | 28,144 | 18,352 | 9,792 | 21,584 | 6,560 | 24,816 | 3,328 | 28,048 | 96 | 31,280 | _ |
| 12 | 15,280 | 28,336 | 18,546 | 9,790 | 21,812 | 6,524 | 25,078 | 3,258 | 28,344 | _ | 31,610 | _ |
| 13 | 15,440 | 28,528 | 18,740 | 9,788 | 22,040 | 6,488 | 25,340 | 3,188 | 28,640 | _ | 31,940 | _ |
| 14 | 15,600 | 28,720 | 18,934 | 9,786 | 22,268 | 6,452 | 25,602 | 3,118 | 28,936 | _ | 32,270 | _ |
| 15 | 15,760 | 28,912 | 19,128 | 9,784 | 22,496 | 6,416 | 25,864 | 3,048 | 29,232 | _ | 32,600 | _ |
| 16 | 15,920 | 29,104 | 19,322 | 9,782 | 22,724 | 6,380 | 26,126 | 2,978 | 29,528 | _ | 32,930 | _ |
| 17 | 16,080 | 29,296 | 19,516 | 9,780 | 22,952 | 6,344 | 26,388 | 2,908 | 29,824 | _ | 33,260 | _ |
| 18 | 16,240 | 29,488 | 19,710 | 9,778 | 23,180 | 6,308 | 26,650 | 2,838 | 30,120 | _ | 33,590 | _ |
| 19 | 16,400 | 29,680 | 19,904 | 9,776 | 23,408 | 6,272 | 26,912 | 2,768 | 30,416 | _ | 33,920 | _ |
| 20 | 16,560 | 29,872 | 20,098 | 9,774 | 23,636 | 6,236 | 27,174 | 2,698 | 30,712 | _ | 34,250 | _ |
| 21 | 16,745 | 30,094 | 20,322 | 9,772 | 23,899 | 6,195 | 27,476 | 2,618 | 31,053 | _ | 34,630 | _ |
| 22 | 16,930 | 30,316 | 20,546 | 9,770 | 24,162 | 6,154 | 27,778 | 2,538 | 31,394 | _ | 35,010 | _ |
| 23 | 17,115 | 30,538 | 20,770 | 9,768 | 24,425 | 6,113 | 28,080 | 2,458 | 31,735 | _ | 35,390 | _ |

ජාතික වැටුප් හා සේවක [illegible]

III

Group - C - 2016

| Salary Step | As at 2015.12.31 | | As at 2016.01.01 | | As at 2017.01.01 | | As at 2018.01.01 | | As at 2019.01.01 | | As at 2020.01.01 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Basic Salary (Rs.) | Gross Salary (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) |
| 1 | 14,670 | 27,621 | 17,806 | 9,815 | 20,942 | 6,679 | 24,078 | 3,543 | 27,214 | 407 | 30,350 | _ |
| 2 | 14,830 | 27,805 | 18,000 | 9,805 | 21,170 | 6,635 | 24,340 | 3,465 | 27,510 | 295 | 30,680 | _ |
| 3 | 14,990 | 27,989 | 18,194 | 9,795 | 21,398 | 6,591 | 24,602 | 3,387 | 27,806 | 183 | 31,010 | _ |
| 4 | 15,150 | 28,180 | 18,388 | 9,792 | 21,626 | 6,554 | 24,864 | 3,316 | 28,102 | 78 | 31,340 | _ |
| 5 | 15,310 | 28,372 | 18,582 | 9,790 | 21,854 | 6,518 | 25,126 | 3,246 | 28,398 | _ | 31,670 | _ |
| 6 | 15,470 | 28,564 | 18,776 | 9,788 | 22,082 | 6,482 | 25,388 | 3,176 | 28,694 | _ | 32,000 | _ |
| 7 | 15,630 | 28,756 | 18,970 | 9,786 | 22,310 | 6,446 | 25,650 | 3,106 | 28,990 | _ | 32,330 | _ |
| 8 | 15,790 | 28,948 | 19,164 | 9,784 | 22,538 | 6,410 | 25,912 | 3,036 | 29,286 | _ | 32,660 | _ |
| 9 | 15,950 | 29,140 | 19,358 | 9,782 | 22,766 | 6,374 | 26,174 | 2,966 | 29,582 | _ | 32,990 | _ |
| 10 | 16,110 | 29,332 | 19,552 | 9,780 | 22,994 | 6,338 | 26,436 | 2,896 | 29,878 | _ | 33,320 | _ |
| 11 | 16,270 | 29,524 | 19,746 | 9,778 | 23,222 | 6,302 | 26,698 | 2,826 | 30,174 | _ | 33,650 | _ |
| 12 | 16,430 | 29,716 | 19,940 | 9,776 | 23,450 | 6,266 | 26,960 | 2,756 | 30,470 | _ | 33,980 | _ |
| 13 | 16,615 | 29,938 | 20,164 | 9,774 | 23,713 | 6,225 | 27,262 | 2,676 | 30,811 | _ | 34,360 | _ |
| 14 | 16,800 | 30,160 | 20,388 | 9,772 | 23,976 | 6,184 | 27,564 | 2,596 | 31,152 | _ | 34,740 | _ |
| 15 | 16,985 | 30,382 | 20,612 | 9,770 | 24,239 | 6,143 | 27,866 | 2,516 | 31,493 | _ | 35,120 | _ |
| 16 | 17,170 | 30,604 | 20,836 | 9,768 | 24,502 | 6,102 | 28,168 | 2,436 | 31,834 | _ | 35,500 | _ |
| 17 | 17,355 | 30,826 | 21,060 | 9,766 | 24,765 | 6,061 | 28,470 | 2,356 | 32,175 | _ | 35,880 | _ |
| 18 | 17,540 | 31,048 | 21,284 | 9,764 | 25,028 | 6,020 | 28,772 | 2,276 | 32,516 | _ | 36,260 | _ |
| 19 | 17,725 | 31,270 | 21,508 | 9,762 | 25,291 | 5,979 | 29,074 | 2,196 | 32,857 | _ | 36,640 | _ |
| 20 | 17,910 | 31,492 | 21,732 | 9,760 | 25,554 | 5,938 | 29,376 | 2,116 | 33,198 | _ | 37,020 | _ |
| 21 | 18,095 | 31,714 | 21,956 | 9,758 | 25,817 | 5,897 | 29,678 | 2,036 | 33,539 | _ | 37,400 | _ |
| 22 | 18,280 | 31,936 | 22,180 | 9,756 | 26,080 | 5,856 | 29,980 | 1,956 | 33,880 | _ | 37,780 | _ |

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

Group - D - 2016

| Salary Step | As at 2015.12.31 | | As at 2016.01.01 | | As at 2017.01.01 | | As at 2018.01.01 | | As at 2019.01.01 | | As at 2020.01.01 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Basic Salary (Rs.) | Gross Salary (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) | Basic Salary (Rs.) | Adjustment Allowance (Rs.) |
